*සැ. යු.*- 2018.07.26 දින පළ වූ අංක 2,082 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,083 - 2018 අගෝස්තු මස 03 වැනි සිකුරාදා - 2018.08.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1190 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත 2018 ජූලි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 අගෝස්තු මස 24 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අගෝස්තු මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පේෂකර්මාන්ත උපදේශක/ උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018

වයඹ පළත් සභා රාජ්‍ය සේවයේ පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ පේෂකර්මාන්ත උපදේශක/ උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018 සැප්තැම්බර් මස කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයකදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

1.0 *වැටුප් ක්‍රමය ඃ*

2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදල මාසික වැටුප් පරිමාණය MN-1-2016 අනුව
රුපියල් 27,140 - 10 x 300 – 11 x 350 – 10 x 495 – 10 x 660 – රු. 45540 වේ.

නමුත් 2020.01.01 දක්වා වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

2.0 *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් ඃ*

2.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

*(අ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී ගණිතය සහ සිංහල / දෙමළ භාෂාව හා තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත්ව තිබීම. ඉන් එක් විභාග අවස්ථාවකදී අවම වශයෙන් විෂයයන් තුනකට (03) සම්මාන සහිතව ගණිතය විෂයය සමග විෂයයන් හයක් (06 සමත්ව තිබිය යුතුය.

*සහ*

*(ආ)* අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

*විශේෂ සටහන.-*

වර්ෂ 02කට නොඅඩු කාලයක් වයඹ පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් පේෂකර්මාන්ත මධ්‍යස්ථානයක කාර්මිකයෙක්/ කාර්මිකාවක් ලෙස සේවයකර ඇති අයදුම්කරුවන් ගණිතය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම ප්‍රමාණවත් වේ. (මෙම සටහන යටතේ අයදුම්කරන අයදුම්කරුවන් ඒ බව ආයතන ප්‍රධානියා මඟින් සනාථ කළ යුතු වේ.)

2.2 *වෘත්තීය සුදුසුකම්.-* පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ පුහුණු ආයතනයකින් අදල පුහුණුව ලබා පේෂ කර්මාන්ත අවසාන සහතිකය ලබා තිබීම.

2.3 *කායික සුදුසුකම්.-* සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

2.4 *වෙනත් සුදුසුකම්.-*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

II. තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ සථිර පදිංචිකරුවන් විය යුතුය. (ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය අදාල ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන්කර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පදිංචිය සනාථ කළ යුතුය.)

III. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

IV. සියලු අධ්‍යාපන, වෘත්තීය හා අනෙකුත් සුදුසුකම් 2018.08.31 දිනට සම්පූර්ණකර සහතික ලබා තිබිය යුතු ය.

V. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය / පළාත් සභා රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ. ඔවුන් සිය අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

3.0 *සේවා කොන්දේසි.-*

I. මෙම තනතුර ස්ථිරය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

II. මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ ඇය පරිවාස කාලය තුල සිය රාජකාරි වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා සේවය ස්ථිර කිරීම සඳහා වන අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණකර තිබේනම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05ක් ඇතුලත සේවයට බැඳුණු භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීනතාව ලබාගත යුතුය.

IV. මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, මුදල් රෙගුලාසි වලටද, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහය, වයඹ පළාත් විනය කාර්ය සංග්‍රහය, වයඹ පළාත් සභා කාර්ය පරිපාටික රීති, දෙපාර්තමේන්තු නියෝග හා රජය හා වයඹ පළාත් සභාව විසින් පනවනු ලබන වෙනත් විධිවිධානවලට යටත් විය යුතුය.

4.0 *බඳවා ගැනීමේ ක්‍රමය :*

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් විසින් සිදුකරනු ලබන ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ හා ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණු ප්‍රමුඛතාවය හා පුරප්පාඩු සංඛ්‍යාව අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එයින් සුදුසුකම්ලත් අයදුම්කරුවන් පේෂකර්මාන්ත උපදේශක/ උපදේශිකා III වන ශ්‍රේණියට බඳවා ගැනේ.

5.0 *විභාග ක්‍රමය :*

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන මාධ්‍ය වලින් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) ලිඛිත විභාගය.-

| *විෂයයන්* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| පේෂ සටහන් | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍ර රෙදි විවීමේදී උපයෝගී කරනු ලබන සියලුම වියමන් ක්‍රම සහ මෝස්තර නිර්මාණය පිළිබඳ දැනුම පරික්ෂා කිරීම |

| *විෂයයන්* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| යන්ත්‍ර සටහන් | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍රයක උපාංග හා උපකරණ හඳුනා ගැනීම හා ඒවායේ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |
| පේෂ ගණිතය | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේදී යොදා ගනු ලබන ගණිත ක්‍රමයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |
| සාමාන්‍ය දැනුම | පැය 01 යි විනාඩි 30 යි | 100 | 40 | අත් යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනයේ ඉතිහාසය, නව ප්‍රවනතාව, අලෙවිකරණය හා කළමනාකරණය ඇතුළුව අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම |

ඉහත එක් එක් විෂයන්ට අදාලව ප්‍රශ්න පත්‍ර හතරක් සකස් කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සමත්වන අයදුම්කරුවන් ප්‍රායෝගික පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය

| *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් ලකුණු* | *විෂය නිර්දේශය* |
|---|---|---|---|---|
| ප්‍රායෝගික පරීක්ෂණය | විනාඩි 30 යි | 100 | 40 | 01. අත් යන්ත්‍ර රෙදිපිළි වියවීම, මෝස්තර නිර්මාණය, අත් යන්ත්‍රයක් වියවීම සඳහා සකස් කර ගැනීම, ඒ සඳහා යොදාගත් උපකරණ පිළිබඳ ප්‍රායෝගික දැනුම පරික්ෂා කර බැලීම.<br>02. දෙන ලද කාලයකදී යන්ත්‍රගත වෝපයක දෙන ලද මෝස්තරයක් වියවීමට සැලස්වීම. වියන ලද ප්‍රමාණය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. වියවීමේදී ඇතිවන දෝෂ සඳහා ලකුණු අඩු කරනු ලැබේ. (පලුදු, රීඩ් මාර්ක්, පා පොලු පෑගීමේ වැරදි, ෂටල් වැටීම යනාදිය.) |

6.0 විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරණ ආදායම් ශීර්ෂයට බැරවන පරිදි තමුන් වයඹ පළාතේ පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබාගන්නා ලද ව.ප.ස.මු/ 2 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව සැළකිය යුතුය. මුදල් ගෙවූ ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.0 *ඉල්ලුම් කිරීමේ ක්‍රමය.-*

7.1 මෙම නිවේදනයේ අවසානයට ඇති ආදර්ශ ආකෘතියට අනුව A 4 ප්‍රමාණයේ (සෙ.මී. 21x29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අංක 01 සිට 04 තෙක් පළමු පිටුවට ද 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටු වලට ද ඇතුලත් වන සේ අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018.08.31 දින හෝ එදිනට පෙර ලැබෙන පරිදි ''ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පේෂකර්මාන්ත උපදේශක/ උපදේශිකා III ශ්‍රේණියට බඳවා ගැනීම - 2018"** යනුවෙන් සඳහන් කළ යුතුය. (දැනටමත් රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතු වේ.)

7.2 *අත්සන සහතික කිරීම.-* මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්වයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥයෙකු / යුධ හමුදවේ හෝ ගුවන් හමුදවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු හෝ රු. 32,960 හෝ රජයේ ඉහළ මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.

8.0 අයදුම්පත් භාරගන්නා අවසාන දිනය.- 2018.08.31 වේ.

9.0 මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම්වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් පරික්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ පත්වීම ලැබීමට ඇති හිමිකම අවලංගු කරනු ලැබේ. සෑම අයදුම්කරුවෙකුම අදළ සියළුම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10.0 *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය.-* අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ජාතික හැඳුනුම්පත ;
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන :* විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු ලෙස සළකනු ලැබේ.

11.0 විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් කාලසටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලීය වෙබ් අඩවියේ (www.psc,nw.gov.lk) නිවේදනයක් පළ කරනු ඇත. විභාග නිවේදනය පලවී දින 2ක් ගත වූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේදී පහත විස්තර ඉදිරිපත් කළ යුතුය :

I. විභාගයේ නම :..............................................
II. අයදුම්කරුගේ සම්පූර්ණ නම :........................................
III. ලිපිනය :................................................
IV. ජාතික හැඳුනුම්පත් අංකය :.............................................
V. අයදුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය :..............................................
VI. ලියාපදිංචි අංකය හා දිනය :..........................................

12.0 යම් අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව පත්වීම ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම කරනු ලැබේ.

13.0 මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොකිරීම පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

14.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණී කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 ජුලි මස 19 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පේෂකර්මාන්ත උපදේශක/ උපදේශිකා (III ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2018**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල : ☐ දෙමළ : ☐ ඉංග්‍රීසි : ☐

අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.

1. 1.1 මුල්'කුරු සමග නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................

..........................................................................................

1.2 මුල්'කුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................

..........................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : ..........................................................................................

..........................................................................................

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................

..........................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2. 2.1 ස්ථිර ලිපිනය : ..........................................................................................

..........................................................................................

2.2 දුරකථන අංකය : පෞද්ගලික : ..........................................................................................

3. ස්ත්‍රී පුරුෂ භාවය (අදාල කොටුව තුල ✓ ලකුණ යොදන්න.)

ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

4. උපන් දිනය :- වර්ෂය : ........................... මාසය : ...................... දිනය : .....................

4.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2018.08.31 දිනට වයස :

අවුරුදු : ............... මාස : ................. දින : ................

5. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 3.1 යටතේ)

*(අ)* අ.පො.ස. (සා.පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා විභාග අංකය :

පළමුවර : වර්ෂය :.................................... දෙවන වර : වර්ෂය :.............................................

විභාග අංකය :.......................................... විභාග අංකය :.......................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | |
|---|---|---|---|---|---|
| | *පළමුවර* | *දෙවනවර* | | *පළමුවර* | *දෙවනවර* |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

*(ආ)* (i) අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය :.........................

(ii) විභාග අංකය :..........................................

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* | *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |

*(ඉ)* වෘත්තීය සුදුසුකම් :

(නිවේදනයේ අංක 3.2 යටතේ හදාරා ඇති පාඨමාලා පිළිබඳව පැහැදිලිව සඳහන් කරන්න.)
මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති නම් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |

06. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය : ............................................................

දිනය : ....................................

ලදුපත ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : ....................................................

| |
|---|
| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |

07. .................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සඳහන් කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් වයඹ පළාත් සභාවේ පේෂකර්මාන්ත උපදේශක / උපදේශිකා III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද, මට විරුද්ධව විනයානුකූල කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවම දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :................................

අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

(අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කරන ....................................... මයා / මිය /මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, විභාග ගාස්තු ගෙවා ඇති බවද ....................................... අංක දරන ලදුපත අලවා ඇති බවද, ඔහු/ ඇය ....................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

අත්සන සහතික කරන අයගේ නම ඃ ............................................................
අත්සන ඃ ............................................................
තනතුර හා නිල මුද්‍රාව ඃ ............................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥයෙකු / යුධ හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ රු. 32, 960 /- මාසික වැටුපක් ලබන ස්ථිර තනතුරක් දරන රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කළ යුතු වේ.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

(අනවශ්‍ය වචන කපා හරින්න)

මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ........................................................................................................ මහතා / මහත්මිය / මෙනෙවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයෙකු බවද, ඔහු / ඇය ස්ථිර තනතුරක් දරමින් සිටින බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද, ඔහුගේ / ඇගේ අයදුම්පතේ දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු / ඇය සුදුසු බවද මම සහතික කරමි.

නිවේදනයේ 3.1 යටතේ ඇති විශේෂ නිවේදනයට අනුව අයදුම්කර ඇති අයදුම්කරුවකු නම් පමණක් මෙම කොටස සම්පූර්ණ කරන්න.

මෙම අයදුම්කරු / අයදුම්කාරිය වයඹ පළාත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවට අයත් ......................... පේෂකර්මාන්ත මධ්‍යස්ථානයේ කාර්මිකයෙකු /කාර්මිකාවක ලෙස ....................... සිට ....................... දක්වා සේවය කර ඇති / කරන බව සහතික කරමි.

................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න.)

08-221

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2018 වර්ෂය** | | | |
| **අගෝස්තු** | 2018.08.03 | සිකුරාදා | 2018.07.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.10 | සිකුරාදා | 2018.07.26 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.08.17 | සිකුරාදා | 2018.08.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.24 | සිකුරාදා | 2018.08.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.08.31 | සිකුරාදා | 2018.08.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2018.09.07 | සිකුරාදා | 2018.08.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.14 | සිකුරාදා | 2018.08.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.21 | සිකුරාදා | 2018.09.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.09.28 | සිකුරාදා | 2018.09.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ඔක්තෝබර්** | 2018.10.05 | සිකුරාදා | 2018.09.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.12 | සිකුරාදා | 2018.09.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.19 | සිකුරාදා | 2018.10.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.10.26 | සිකුරාදා | 2018.10.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.